**ශීර්ෂය 269 - මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

**-------------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 269 - මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 26 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 මැයි 25 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන ලෙස පිළියෙල කර ඇති බව මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන ලෙස පිළියෙල කර ඇත.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරින්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය | | |
| පාලක ජනරාල්වරයා වෙත ඉදිරිපත් කර තිබුණු වාර්තාවලට අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට හා ප්‍රාදේශිය ලේකම් කාර්යාල 14 කට අයත් ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් 14 ක් ලෙස ඇස්තමේන්තු කර තිබුණ අතර එහි වටිනාකම රු. මිලියන 559 ක් ලෙස මූල්‍ය නොවන වත්කම් යටතේ දක්වා තිබුණි. එසේ වුවත් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි (ඒසීඒ-පී) දක්වා තිබුණු ඉඩම්වල වටිනාකමෙහි මුළු එකතුව රු. මිලියන 487 ක් විය. මේ අනුව ඉහත ප්‍රකාශනයෙන් දෙකෙහි දක්වා තිබුණු ඉඩම් වටිනාකම් අතර රු. මිලියන72ක වෙනසක් නිරීක්ෂණය විය. එසේ වුවත්, මෙකී වෙනස්කම් නිවැරදි කිරීමට හා මෙම ඉඩම්වල අයිතිය ප්‍රදේශිය ලේකම්කාර්ය වෙත ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉඩම්වල අයිතිය ලබා ගැනීමට අදාළ අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල ඉටුකර ඇත. | ඉඩම්වල අයිතීන් ලබාගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 තැන්පත්

| විගණන නිරීක්ෂණය | ගණකාධිකාරීන්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ------------------------- | ------------------ | -------------- |
| ප්‍රාදේශිය ලේකම් කාර්යාල 04 ක් වෙත ඉඩම් අත්පත් කර ගැනීම සඳහා ලබාදී තිබුණු රු. මිලියන 9.9 ක් අදාළ කාර්ය සඳහා උපයෝජනය නොකර තැන්පත් ගිණුමෙහි වර්ෂ 2 ත් 5 ත් අතර කාලයක සිට රඳවාගෙන තිබුණි. | ඉඩම් අත්පත් කර ගැනීම සඳහා දීර්ඝ පරිපාලන ක්‍රියාවලියක් ඉටු කිරිමට සිදු වේ. මෙම ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් ඉටුකරමින් පවතී. | මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව, තැන්පත් නිරවුල් කිරිම සඳහා කටයුතු කල යුතුය. |

### 2.2 ගණකාධිකාරීයා සහතිකය කල

| විගණන නිරීක්ෂණය | ගණකාධිකාරීන්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ------------------------ | ------------------------------------- | --------------------------------- |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය තුළ මූල්‍ය පාලනය සම්බන්ධ ඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් ක්‍රියාත්මක වන බවට ප්‍රධාන ගණකාධිකාරීයා සහතික කල යුතුය. එසේම පවතින අභ්‍යන්තර පාලන පද්ධතියෙහි ඵලදායිතාවය පිළිබඳව කාලීනව සමාලෝචනය කර, පාලන පද්ධතිය ඵලදායිව පවත්වාගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදුකල යුතුය. මෙවැනි සමාලෝචන ලිඛිතව සිදුකල යුතු අතරම එහි පිටපත් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුවේ. එසේ වුවත්, අදාළ සමාලෝචනයන් සිදුකර විගණකාධිපතිවරයා වෙත වාර්තා කිරිමට කටයුතු කර නොතිබුණි. | මෙම වරද නිවැරදි කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත. | 2018 අංක 19 දරන විගණන පනතේ 38 වගන්තියේ සඳහන් නියමයන්ට අනුකූලව කටයුතු කල යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අපේක්ෂිත අරමුණු ලගාකර නොගැනීම

| | විගණන නිරික්ෂණය | ගණන්දීමේ නිලධාරින්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කිරාන් බටහිර ප්‍රදේශයේ සත්ව පාලනය සඳහා පුද්ගලයින් දෙදෙනෙකු තෝරාගෙන තිබුණද පුද්ගලයින් තෝරා ගැනීමේ නිර්ණායකයන්ට අනුකූල නොවන පරිදි අදාළ තෝරා ගැනීම් සිදුකර තිබීම හේතුවෙන් තෝරාගෙන තිබුණු පුද්ගලයන්ට ගවයන් 25 කට වැඩි ප්‍රමාණයක් හා කුඹුරු අක්කර 50 කට වැඩි ප්‍රමාණයක් හිමි පොහොසත් පුද්ගලයින් බව අනාවරණය විය. | පෙන්වා දී ඇති කරුණු සම්බන්ධව අවශ්‍ය පියවර ගැනීමට නියමිතය. | ප්‍රතිලාභ ලබාදිම සඳහා පුද්ගලයන් තෝරා ගැනිමේදී නියමිත තෝරා ගැනීමේ නිර්ණායකයන්ට අනුකූලව කටයුතු කල යුතුය. |
| (ආ) | රු.4,387,500 ක් වැයකර කෘෂි කර්මාන්තයේ යෙදෙන ගොවින් 90 දෙනෙකු අතර බෙදාදීම සඳහා වතුර මෝටර් 90 ක් මිලට ගෙන තිබුණි. එසේ වුවත්, බෙදා දී තිබුණු වතුර මෝටර් වලින් වැඩි ප්‍රමාණයක් කෘෂිකාර්මික කටයුතු සඳහා යොදවා ගැනිමකින් තොරව නිවෙස්වල නිෂ්කාර්යව තබා ඇති බව නිරික්ෂණය විය. තවද, භාවිතයට ගෙන තිබුණු වතුර මෝටර් ගොවින්ගේ නිවෙස්වලින් බොහෝ දුරින් පිහිටි ගොඩබිම් වල සවිකර තිබුණු බැවින් එසේ භාවිතයට ගෙන තිබුණු වතුර මෝටර්ද අනාරක්ෂිතව පවතින බව නිරික්ෂණය විය. | පෙන්වා දී ඇති කරුණු සම්බන්ධව අවශ්‍ය පියවර ගැනීමට නියමිතය. | වතුර මෝටර් ලබාදීමේ අරමුණුගත කාර්ය සඳහා ඒවා යොදවා ගැනිමට කටයුතු කළ යුතුය. එසේම භාවිතා කරන වතුර මෝටර්වල ආරක්ෂාව සම්බන්ධව සුදුසු පියවරද ගත යුතුය. |

## 3.2 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදයන්

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරින්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------- | ------------------ | -------------- |
| (අ) | ශ්‍රී ලංකා රජය විසින් එක්සත් ජාතීන්ගේ ලෝක ආහාර වැඩසටහන හා කොරියානු ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය (කොයිකා) සමඟ එක්ව, ජනතාවගේ ස්වාභාවික ව්‍යසන වලින් වන බලපෑමට ඔරොත්තුදීමේ හැකියාව වර්ධනය කිරිම සඳහා වර්ෂ 03 ක කාලයක් සඳහා ව්‍යාපෘතියක් ආරම්භ කර තිබුණි. ව්‍යාපෘතියෙහි ඉලක්කය වූයේ අවදානමට ලක්විය හැකි ග්‍රාමීය ජනතාව ශක්තිමක් කිරීමේ වැඩසටහනක් සැලසුම් කිරිමයි. එසේ වුවත් කොට්ඨාශයේ වැඩසටහන් සඳහා තෝරාගෙන තිබුණු ජනතාව සමඟ වැඩසටහන් සඳහා තෝරා නොගත් ජනතාව සසඳා බැලීමේදී තෝරාගෙන තිබුණු ජනතාව අවධානමට ලක්විය නොහැකි පුද්ගලයන් බව පරීක්ෂණය විය. තෝරාගෙන තිබුණු බොහෝ පුද්ගලයන්, සත්ව පාලනය , එළුවන් බලාගැනීම, කෘෂි කාර්මික ලිං ඉදිකිරිම සහ කුඩා වාරිමාර්ග පද්ධති පවත්වාගෙන යාම සිදුකරනු ලබයි. ඇතැම් තෝරාගත් ප්‍රතිලාභීන්ට අක්කර 2 කට වැඩි කුඹුරු ද සතුන්ද හිමිව තිබුණි. උදාහරණයක් ලෙස ප්‍රතිලාභීන් දෙදෙනෙකුට සතුන් 107 ක් ද, ඉන් එක් අයෙකුට මන්ඩපන්නාඩි ගොවිජන සේවා බල ප්‍රෙද්ශය තුළ පිහිටි කුඹුරු අක්කර 8 ක්ද තිබුණු බව නිරීක්ෂණය විය. | පෙන්වා දී ඇති කරුණු සම්බන්ධව අවශ්‍ය පියවර ගැනිමට නියමිතය. | ව්‍යාපෘතියේ ප්‍රතිලාභීන් තෝරා ගැනීමේ නිර්ණායකයන්ට අනුව ප්‍රතිලාභීන් තෝරා ගැනිමට පියවර ගත යුතුය. |
| (ආ) | එළුවන් 10 දෙනෙකුට වඩා අඩුවෙන් එළුවන් ඇතිකරනු ලබන පවුල්වලට එම එළුවන් දැඩි අර්ධ කළමනාකරණයක් යටතේ පාලනය කිරිම සඳහා වැඩිදියුණු කරන ලද එළු කොටු ඉදිකර ගැනීම සඳහා එක් | පෙන්වා දී ඇති කරුණු සම්බන්ධව පියවර ගැනීමට නියමිතය. | අදාළ ව්‍යාපෘතියේ ප්‍රතිලාභින් තෝරා ගැනීමේ නිර්ණායකයන්ට අනුව තෝරා ගැනීමට කටයුතු කළ යුතුය. |

පවුලකට රු. 215,000 බැගින් වූ මූල්‍ය ආධාරයක් ප්‍රධානය කර තිබුණි. එසේ වුවත් ප්‍රතිලාභීන් තෝරා ගැනීමේදී තෝරාගැනීමේ නිර්ණායකයන් සැලකිල්ලට නොගෙන එළුවන් 10 දෙනෙකුට වඩා ඇති පවුල් සඳහා මූල්‍ය ආධාර ලබා දි තිබුණු බව නිරික්ෂණය විය. එසේම එළු පාලනය සඳහා ආධාර ලබාදීමේදී තරුණ තරුණියන්ට ප්‍රමුඛතාවය ලබාදිය යුතු බවටද නිර්ණය කර තිබුණි. එසේ වුවත්, තෝරා ගෙන තිබුණු ප්‍රතිලාභින් 61 දෙනෙකු වයස අවුරුදු 50 ඉක්ම වූ පුද්ගලයන් වූ අතර දෙදෙනෙකු වයස අවුරුදු 77 ක් වූ පුද්ගලයන් විය.

## 3.3 පාඩු හා හානි

| විගණන නිරික්ෂණය | ගණන්දීමේ නිලධාරින්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ------------------------- | ------------------ | -------------- |
| කාන්තන්කුඩිය ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට අනුයුක්ත කර තිබුණු වාහනයක් 2021 ජනවාරි මාසයේදී අනතුරකට භාජනය විම සම්බන්ධයෙන් පරීක්ෂණයක් කිරීම සඳහා පරික්ෂණ මණ්ඩලයක් පත්කර තිබුණද අදාළ පරික්ෂණ වාර්තාව 2023 මැයි මාසය අවසානය දක්වා අවුරුදු 2 ½ ක් ගත වූ පසුවද ඉදිරිපත් කර නොතිබුණි. එසේම මන්මුනෝ දකුණු හා එරුවිල් පත්තු ප්‍රාදේශිය ලේකම් කාර්යාල වලට අනුයුක්ත කර තිබුණු වාහන 2 ක් 2014 වර්ෂයේද් අනතුරු වලට භාජනය වි තිබුණි. එසේ වුවත් ඒ පිළිබඳ පරීක්ෂා කිරිම සඳහා පරීක්ෂණ මණ්ඩලයක් 2022 වර්ෂයේ අවසානය දක්වාම මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පත්කර නොතිබුණි. එම නිසා මෙම අනතුරුවලට වගකිව යුතු නිලධාරීන් හඳුනා ගැනීමට සහ අදාළ අලාභ අයකර ගැනීමට නොහැකි වී තිබුණි. | පෙන්වා දී ඇති කරුණු සම්බන්ධව පියවර ගැනීමට නියමිතිය. | පරීක්ෂණ කඩිනම්කර අලාභ අයකර ගැනීමට අවශ්‍යා පියවර ගත යුතුය. |

### 3.4 කළමනාකරණ දුර්වලතා

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරින්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------- | ------------------ | -------------- |
| (අ) | මන්මුනේ එරුවිල්පත්තු ප්‍රාදේශිය ලේකම් කාර්යාලය යටතේ ඇති තෙන්නතිව් උතුර දකුණු ග්‍රාම නිලධාරි කාර්යාලය නිකුත්කර තිබුණු රිසිට් පොත (පොදු 172) අවසාන වී තිබුණද, මහජනයාගේ මුදල් අයකරනු ලබන කාර්යන් ඉටුකර ඒ සඳහා රිසිට් පත් නිකුත් කිරිම සඳහා අලුත් රිසිට් පොතක් 2022 අගෝස්තු 26 දින සිට ලබාගැනීම කටයුතු කර නොතිබුණි. | පෙන්වා දී ඇති කරුණු සම්බන්ධව පියවර ගැනිමට නියමිතය. | මහජනයාගේ අයකරනු ලබන මුදල් සඳහා ලදුපත් ලබාදීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශය තුළ පිහිටි ග්‍රාම සේවා නිලධාරින් පත්කිරිමේදී ග්‍රාම සේවා නිලධාරී කොට්ඨාශය තුළ පදිංචි පවුල් සංඛ්‍යාව වැනි තාර්කික හා සාධාරණ ප්‍රතිපත්තියක් අනුගමනය නොකර මන්මුනේ දකුණු එරුවිල් පත්තු ප්‍රාදේශිය ලේකම් කාර්යලය විසින් විධිමත් පදනමකින් තොරව ග්‍රාම නිලධාරීන් පත්කර තිබුණි. | පෙන්වා දී ඇති කරුණු සම්බන්ධව පියවර ගැනීමට නියමිතය. | ග්‍රාම නිලධාරින් පත් කිරිම විධිමත් පදනමක් අනුගමනය කරමින් සිදු කිරිමට පියවර ගත යුතුය. |

### 3.5 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරින්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------- | ------------------ | -------------- |
| (අ) | ප්‍රාදේශිය ලේකම්වරයාගේ නිර්දේශයකින් තොරව හා වැලි කැණීමේ කටයුතු කිරිම සඳහා ප්‍රාදේශය තුළ ගංගාවක් පිහිටා නොමැති තත්ත්වයක් යටතේ කෝරළේ පත්තු දකුණු ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට යටතේ ඇති කිරාන් ඉටහිර ග්‍රාම නිලධාරි කාර්යාලය මඟින් ගංගා වැලි කැණීම් බලපත්‍රයක් නිකුත් කර තිබුණි. තවද, කැණීම් හා ඛනිජ ද්‍රව්‍ය පනතේ විධිවිධාන වලට අනුව බලපත්‍රය වලංගු | පෙන්වා දී ඇති කරුණු සම්බන්ධව පියවර ගැනීමට නියමිතය. | වැලි කැණීම් බලපත්‍ර නිකුත් කිරිම නිර්දේශ කිරීමට අදාළව ශක්තිමක් අභ්‍යන්තර පාලන පද්ධතියක් හඳුන්වා දීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වන්නේ ගංගාවලින් වැලි කැණීම් කටයුතු අදාළ බලප්‍රදේශය තුළ සිදු කිරිම සඳහා පමණි. එසේ වුවත් මෙම බලපත්‍රය උපයෝගී කරගෙන භූමියෙන් වැලි කැණීම් කටයුතු සිදුකර තිබුණි. එසේම අනුමත කරන ලද ව්‍යාපෘතියක් නොමැතිව වැලි කියුබ් 1400 ක් මාස 2 ක් ඇතුළත අලෙවි කර තිබුණි. | | |
| (ආ) | කෝරළේ පත්තු දකුණු ප්‍රාදේශය ලේකම් කොට්ඨාශයෙහි පිහිටි වැලිආරු හා මාදුරුඔය ගංගා ඉවුරු ආශ්‍රිතව හා මෙම ස්ථානවලින් බැහැරව පිහිටි මුල්ලිවන්කම් නිරයිඩායි හා වාවල් නිරයිඩායි යන ප්‍රාදේශවල කැණීම් කර නීති විරෝධිව වැලි ලබාගෙන තිබුණි. මෙම නීති විරෝධි කැණීම් කටයුතු හේතුවෙන් විශාල පරිසර හානියක් සිදුව තිබුණු අතර ගංගාවේ ස්වාභාවික ජල ප්‍රවාහයේ දිශාව පවා වෙනස් වී තිබුණි. එසේ වුවත් මෙම නීති විරෝධි කටයුතු මැඩපැවැත්වීම සඳහා කටයුතු කලයුතු ප්‍රාදේශිය ලේකම් කාර්යාලය මේ සම්බන්ධව ඵලදායි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | පෙන්වා දී ඇති කරුණු සම්බන්ධව පියවර ගැනීමට නියමිතය. | මෙකී නීති විරෝධි වැලි කැණීම් කටයුතු නැවැත්වීම සඳහා ශක්තිමත් අභ්‍යන්තර පාලන යාන්ත්‍රණයක් ස්ථාපිත කළ යුතුය. |
| (ඇ) | 2000 අංක 46 දරන කෘෂි කාර්මික සංවර්ධන පනතේ 33 වගන්තිය ප්‍රකාරව කුඹුරු ඉඩම්වල මතුපිට පස්තට්ටුව ඉවත් කිරිම සඳහා කෘෂිකාර්මික සංවර්ධන දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය කොමසාරිස්වරයාගේ අනුමැතිය ලබාගත යුතු වුවත් එම අනුමැතිය ලබාගැනිමෙන් තොරව, කුඹුරු ඉඩම්වලින් තම පෞද්ගලික ප්‍රයෝජනය සඳහා වැලි කැණීම් කිරීම සඳහා බලපත්‍ර ලබාදීමට ප්‍රාදේශිය ලේකම්වරයා තම නිර්දේශය භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යාංශය වෙත ලබා දී තිබුණි. මෙම නිර්දේශය මත තම කුඹුරු ඉඩම් වලින් වැලි කැණීම් කටයුතු කර තුන්වන පාර්ශවයක් වෙත | පෙන්වා දී ඇති කරුණු සම්බන්ධව පියවර ගැනීමට නියමිතය. | කුඹුරු ඉඩම් හා එහි පස් ආරක්ෂා කර ගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය. |

විකිණීමකින් තොරව කුඹුරු ඉඩම්හිමියන්ගේ ප්‍රයෝජනය සඳහා පමණක් වැලි කැණීම් කිරීමට බලපත්‍ර නිකුත් කර තිබුණි. එසේ වුවත්, වැලි කැණීම් විශාල වශයෙන් සිදුකර නීති විරෝධි ලෙස විකුණා තිබුණු බව නිරීක්ෂණය විය.

## 3.6 කොන්ත්‍රාත් පරිපාලනය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරින්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| බදුකරුවන්ගේ මූල්‍ය හා මෙහෙයුම් හැකියාව පිළිබඳ සලකා බැලීමකින් තොරව අලුතින් නවීකරණය කර තිබුණු හා මන්මුණේ බටහිර වවුනතිව් ප්‍රාදේශිය ලේකම් කාර්යාලය මඟින් පාලනය කල හාල් මෝල එහි ගොඩනැඟිලි හා යන්ත්‍රඋපකරන ඇතුලත්ව රු. මිලියන 62.3 කට තක්සේරුකර ආයින්ත්‍යාමලායි ග්‍රාමීය කෘෂිකාර්මික නිෂ්පාදන සමුපකාර සමිතිය වෙත අවුරුදු 3 ක කාලයක් සඳහා බදු දී තිබුණි. මෙම සමුපකාර සමිතිය මෙකී බදු ගැනීමේ කාර්ය සඳහාම වර්ෂ 3 කට පෙර රු. 1,300 ක ප්‍රාග්ධනයක් සහිතව ලියාපදිංචි කර තිබුණු බව නිරීක්ෂණය විය. එසේම මෙම හාල් මෝල නියමිත ආකාරයට නඩත්තු කර එහි අරමුණු ඉටුකර ගැනිම සඳහා මෙහෙය විම බදුදීමේ අරමුණු වුවද, සමාලෝචිත වර්ෂය අවසානය දක්වා වී මිටි 50 ක් පමණක් හාල් බවට පරිවර්තනය කර තිබුණු බව නිරීක්ෂණය විය. | පෙන්වා දී ඇති කරුණු සම්බන්ධව අවශ්‍ය පියවර ගැනීමට නියමිතය. | වෙළඳපල වටිනාකම මත දේපල බදු දීමට බදු දීමට කටයුතු කළයුතු අතර දේපලවල ආරක්ෂාව සඳහා ආරක්ෂිත තැන්පතු ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

**4.** මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරින්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------- | ------------------- | -------------- |
| (අ) | නිලධාරීන් මාරුකිරිමේ ප්‍රතිපත්තියට පටහැනිව හා සේවා අවශ්‍යතාවය නොසලකා නිලධාරින් 98 දෙනකු තම සේවා ස්ථානවලින් ඔවුන්ගේ නිවෙස්වලට ආසන්න කාර්යාල වෙත මාරු කර තිබුණි. | පෙන්වා දී ඇති කරුණු සම්බන්ධව පියවර ගැනීමට නියමිතය. | විධිමත් පදනමක් මත නිලධාරින් මාරු කිරිමට පියවර ගත යුතු වේ. |
| (ආ) | පොදුවේ වර්ෂ 5 කට වරක් නිලධාරින්ට ස්ථාන මාරුවිම් ලබාදිමට කටයුතු කලයුතු වුවත්, පිළිගත හැකි හේතුන් නොමැතිව නිලධාරින් 188 කට වැඩි ප්‍රමාණයකට (රේඛීය අමාත්‍යාංශවලට අනුයුක්ත කර තිබුණු නිලධාරින් 54 ක්ද ඇතුළුව) තමාගේ නිවසට ලගම ඇති සේවා ස්ථානවල වර්ෂ 5 කට වැඩියෙන් සේවය කිරිමට අවස්ථාව සලසාදී තිබුණි. එසේම, නිලධාරින් 5 දෙනෙකු වර්ෂ 22කට වැඩි කාලයක් එකම සේවා ස්ථානයේද, තවත් නිධාරින් 98 දෙනෙකු (රේඛීය අමාත්‍යාංශවලට අනුයුක්ත නිලධාරින් 43 ක්ද ඇතුළුව) වර්ෂ 9 කට වැඩි කාලයක් එකම සේවා ස්ථානයේද සේවය කරමින් පැවතුණි. | පෙන්වා දී ඇති කරුණු සම්බන්ධව පියවර ගැනීමට නියමිතය. | විධිමත් මාරු කිරිම් ප්‍රතිපත්තියක් අනුගමනය කිරිමට පියවර ගත යුතුය. |
| (ඇ) | නිලධාරින් තම අභිමතානුසාරි නිලබලය මත පක්ෂග්‍රාහි පරිපාලන තීරණ ගැනීමට නොහැකිවන පරිදි විධිමත් පරිපාටින් සකස් කර ක්‍රියාත්මක කල යුතුය. එසේ වුවත්, ප්‍රාෙද්ශිය ලේකම් කාර්යාල 6 කට අයත් නිලධාරින් 20 දෙනෙකු විධිමත් ස්ථානමාරු විම් ප්‍රතිපත්තියකට අනුගත නොවී, නැවත නැවතත් ඔවුන්ට ආසන්නතම ප්‍රාදේශිය ලේකම් කාර්යල වෙත වර්ෂ 5 ක සේවා කාලයක් සම්පූර්ණවිමට ප්‍රථම නැවත ස්ථාන මාරුවිම් ලබා දි තිබුණි. | පෙන්වා දී ඇති කරුණු සම්බන්ධව පියවර ගැනීමට නියමිතය. | විධිමත් මාරු කිරිම් ප්‍රතිපත්තියක් අනුගමනය කිරිමට පියවර ගත යුතුය. |